# දේශගුණ විපර්යාස අවම කිරීමෙහිලා ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදයේ දායකත්වය


**අම්බිකා තෙන්නකෝන්**

**පරිසර කළමනාකරණ නිලධාරී, තිරසර සංවර්ධන අංශය**

**පරිසර හා පුනර්ජනීය බලශක්ති අමාත්‍යාංශය**


ශ්‍රී ලංකාව ඇතුළුව බොහෝ රටවල් ඉතිහාසයේ පෙර නොවූ විරූ තරම් බලගතු අර්බුද රාශියකට වර්තමානයේ මුහුණ පාමින් සිටී. මෙම අර්බුද අතුරින් ආහාර, ජලය, බලශක්තිය හා මූල්‍ය වැනි අර්බුද ප්‍රධාන තැනක් ගෙන ඇත. මෙවැනි ගැටලු පැන නැගීමට දිනෙන් දින වර්ධනය වන්නාවූ ජනගහනය, අසීමිතව වර්ධනය වන්නාවූ මිනිස් අවශ්‍යතාවන් හා ආශාවන් හේතු වන අතර ඒ මගින් මිහිතලය මත දැරිය හැකි ජීව ධාරිතාවට බලපෑම් එල්ල වී ඇත. විශේෂයෙන්ම නැවත ජනනය නොවන සම්පත් අධිපරිභෝජනයද පෘථිවිය මත පැවතිය හැකි ස්වාභාවික සම්පත් විනාශවීම ක්‍රමක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. ස්වාභාවික සම්පත් තිරසර නොවන ආකාරයට සිදුවන අධි පරිභෝජන රටාව හා නිෂ්පාදන ක්‍රියාවලිය මගින් ජලය, බලශක්ති හා වනාන්තර වැනි සම්පත් විනාශයට හේතුවී ඇත. එමනිසා අප අවට පරිසරයේ පාරිසරික ගුණාත්මකභාවය පිරිහී පාරිසරික ගැටලු මෙන්ම දේශගුණික විපර්යාසද මතු වී පාරිසරික තත්ත්වය වෙනස්කම් රාශියකට මුහුණපාමින් සිටී.

නිදහසින් පසුව මෙරට තුළ කර්මාන්ත සංවර්ධනට මග පෑදුණු අතර පසුගිය සියවසේ මුල සිට කර්මාන්ත හා සේවා අංශ විසින් ඕනෑම භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනයේදී හෝ පරිභෝජනයේදී ජලය, බලශක්තිය, අමුද්‍රව්‍ය හා ස්වාභාවික සම්පත් භාවිතාකරනු ලැබූ අතර 19 වන සියවසේ සිට ජගත් වෙළඳපලට එක් වූ භාණ්ඩ ප්‍රමාණයද වැඩි වී ඇත. තවද, මිනිසා භාවිතා කරන ලද ජලය, බලශක්ති ප්‍රමාණය සියගුණයකින් වැඩි වී ඇත. එම නිසා භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනයේදී හෝ පරිභෝජනයේදී දූෂක කාරක හා විෂ විමෝචනයන් වායුගෝලයට එකතු විය. සමස්ත කාර්මික නිෂ්පාදන පසුගිය සියවස තුල දහස් ගණනින් වැඩි වී ඇත. එමෙන්ම 20 වන සියවස ආරම්භයෙන් පසුව එතෙක් කෘෂිකර්මය සඳහා යොදාගත් ස්ථිර ගොවි බිම්වලින් වර්ග කිලෝමීටර් විශාල ප්‍රමාණයක් කර්මාන්ත සංවර්ධන කටයුතු හා වෙනත් මානව කටයුතු සඳහා යොදාගෙන ඇත. මිනිසා විසින් වර්ෂයකට ස්වාභාවික ගංගා ඇලදොල හා භූගත ජලයෙන් ලබා ගන්නා වූ ජල ප්‍රමාණය වැඩි වී ඇත.

එලෙසම ගංගා හා ඇලදොල මගින් වාර්ෂිකව සාගරයට රැගෙන යන රොන්මඩ ප්‍රමාණයද අධික ලෙස සිදුවන පාංශු ඛාදනය නිසා ඉහළ ගොස් ඇත. දැනට බෝහෝ කර්මාන්ත ස්ථාපිතව ඇත්තේ ගංගා ඉවුරු හා සංරක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව නිසා කර්මාන්ත මගින් මුදාහරිනු ලබන අපද්‍රව්‍ය හේතුවෙන් ගංගා ජලයේ ගුණාත්මකභාවය පිරිහීමකට ලක්වී පානීය ජල සම්පාදනය පවා ගැටලුවක් වී ඇත.

තවද, වායුගෝලයේ ඇති කාබන්ඩයොක්සයිඩ්, කාබන්මොනොක්සයිඩ්, මීතේන්, සල්ෆර්ඩයොක්සයිඩ් වැනි වායූන් මානව ක්‍රියාකාරකම් හා අධික කාර්මිකරණය නිසා පසුගිය සියවසේ මැද භාගයේ තිබූ ප්‍රමාණයට වඩා දෙගුණයකින් පමණ වැඩි වී ඇත. කාබන්ඩයොක්සයිඩ් වායුව ටොන් මිලියන ගුණයකින් ද භූමි මට්ටමේ ඕසෝන් වායුව සියදහස් ගුණයකින් ද මානව ක්‍රියාකාරකම් නිසා පරිසරයට මුදා හරිනු ලබන ආසනික්, කැඩ්මියම්, රසදිය, නිකල් ප්‍රමාණයද වැඩි වී ඇත. එමෙන්ම කර්මාන්තශාලාවල යන්ත්‍ර සූත්‍රවල අධික තාපය මර්දනය කිරිම සඳහා ඒවා ජලය මගින් සිසිල් කරනු ලබයි. එහිදී ජලයේ උෂ්ණත්වය ඉහල නගින අතර රත්වූ ජලය බාහිර පරිසරයට එකතුවීමෙන් ඒ ආශ්‍රිත පරිසර ජලයේ උෂ්ණත්වය ඉහළ යයි. කාර්මිකරණයේ මෙවැනි අතුරුඵල නිසා අද පෘථිවිය ගිම්හලක් මෙන් ක්‍රම ක්‍රමයෙන් උණුසුම් වෙමින් පවතින බවට ජගත් ප්‍රජාව විසින්ම වටහා ගෙන ඇත. මානව ක්‍රියාකාරකම් හා කර්මාන්ත මගින් පරිසරයට මුදාහරිනු ලබන හරිතාගාර වායූන් ලෙස හඳුන්වන කාබන්ඩයොක්සයිඩ්, නයිට්‍රජන්, ඩයොක්සයිඩ්, මීතේන් හා සල්පර්ඩයොක්සයිඩ් වායුගෝලය තුළ අධික වීමෙන් වායුගෝලයේ උෂ්ණත්වය ඉහළ ගොස් ඇත. තවද කර්මාන්තශාලා විසින් විධිමත් ලෙස පොසිල ඉන්ධන දහනය

නොකිරීමෙන් කාබන් මොනොක්සයිඩ් වැනි වායූන් අධික ලෙස පරිසරයට එකතුවන අතර අධික තාපයක් ද උපදී. පොසිල ඉන්ධන දහනයත් සමග එහි තිබෙන සල්ෆර්, සල්ෆර්ඩයොක්සයිඩ් වැනි ප්‍රබල විෂ වායූන් වර්ෂා ජලයේ දියවී සල්ෆියුරික් අම්ලය නිපදවී ජලාශවල හා පසෙහි අම්ලිකතාවය වැඩිවීම ජීවීන්ගේ පැවැත්මට අහිතකර ලෙස බලපායි. මෙලෙස දිනෙන් දින ඉහළ යන වායු විමෝචන තත්ත්වයන් හේතුවෙන් ඇතිවන වායු දූෂණය, සම්පත් නාස්තිය, ජල දූෂණය, රසායනික ද්‍රව්‍ය ඇතුළු කාර්මික උපද්‍රවකාරී අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම ඉහළ ගොස් ඇත. මෙවැනි කර්මාන්ත මගින් වන පාරිසරික බලපෑම් හේතුකොටගෙන දේශගුණික රටාවේ වෙනස්කම්ද වර්ෂා රටාවේ වෙනස්කම්ද නියඟ හා දරුණු වැසි කුණාටු බහුලවීමටද එහි තීව්‍රතාවය අධිකවීමෙන් හිම දිය වී මුහුදු මට්ටමද ඉහල නැගී මුහුදුබඩ පළාත් ඇතුළුව වගුරුබිම් ජලයෙන් යට වීමේ ප්‍රවණතාවයක් ද ඇත.

මේ අයුරින්, තිරසර නොවන කාර්මික නිෂ්පාදන හා පරිභෝජන ක්‍රියාවලිය දිගින් දිගටම පැවැතියහොත් රටෙහි අඛණ්ඩ තිරසරභාවයට, ස්වාභාවික සම්පත්වල සුරක්ෂිතභාවයට ප්‍රජාවගේ සෞඛ්‍ය සම්පන්නභාවයට, සාමකාමී ජන ජීවිතයට හා පානීය ජලයට පවා අතිශයින් බලපෑම් එල්ල වේ. පසුගිය කාලයේ අත්විඳීමට සිදු වූ දැඩි නියඟය, භයානක ගංවතුර වැනි පාරිසරික තත්ත්වයන් හේතුවෙන් බලශක්ති අර්බුදයේ බලපෑම් ද ජල දූෂණය පිළිබඳව ද ශ්‍රී ලාංකීක අපට අත්දැකීම් ඇත. ස්වාභාවික විපත් බහුල වීමත් සමග ඇති වන ආර්ථික අසමතුලිතතාවය හා එයට සමගාමීව දිනෙන් දින සිදුවන පාරිසරික හානි දැඩි ලෙස වැඩි වී ඇත. ඒ අනුව දැනට පවතින පරිසර නීති හා රෙගුලාසිවලට අදාල ධාරිතා මට්ටම්වලට අනුව අප ජල පිරිපහදුව, අපද්‍රව්‍යය හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය අපහරණය කරමින් පරිසර දූෂණ පාලනය කළ යුතු ව ඇත.

වර්තමානයේ බොහෝ දෙනෙකුගේ අවධානය ගෝලීය පරිසරය, දේශගුණ විපර්යාස පිටු දැකීම හාතිරසරභාවය කෙරෙහි යොමුවීමත් සමගම අපේ රටේත් නිෂ්පාදන හා සේවා අංශ ගෝලීයකරණය කෙරෙහි වැඩි නැඹුරුවක් ඇති වී ගෝලීය වෙළඳපල කෙරෙහි නිෂ්පාදන හා සේවා අංශයේ ධායකත්වය ක්‍රමයෙන් වැඩිවී ඇත. එම නිසා ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ තිරසර කාර්ය සාධනය වාර්තා කිරීම තුලින් පරිසර දූෂණයෙන් තොර උපරිම සම්පත් කාර්යක්ෂම තාවයෙන් තිරසර සංවර්ධනය කරා ලඟා වීමට හැකි පරිදි හරිත කර්මාන්තකරණය කරා යොමුවීම කාලීන අවශ්‍යතාවයක් වේ. ඒ සඳහා සියලූම සමාජ, ආර්ථික, පාරිසරික තත්ත්වයන් අනාවරණය වන පරිදි දේශගුණික විපර්යාසවලින් තොර වූ රටක තිරසර භාවය අනාගත පරපුරට දයාද කිරීම උදෙසා ජාතික වශයෙන් හඳුනා ගත් වැඩපිළිවලක් අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව සමාජ ආර්ථික හා පාරිසරික අංශයන්හි තිරස්ථායීභාවය හා සම්බන්ධව කැපී පෙනෙන්නා වූ ක්ෂේත්‍රයක් ලෙස කර්මාන්ත හා සේවා අංශය හඳුනා ගනිමින් පරිසර හා පුනර්ජනීය බලශක්ති අමාත්‍යාංශය සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව මෙරටෙහි කර්මාන්ත හා සේවා අංශවල තිරසර කාර්යසාධනය වර්ධනය කිරීම උදෙසා වියයුතු වැඩපිළිවලක් ලෙස හරිත වාර්තාකරණ ක්‍රමවේදය හඳුනා ගන්නා ලදී. හරිත ලංකා වැඩසටහනෙහි මෙහෙවර 09 වන කර්මාන්ත හරිතකරණය'' යටතේ කර්මාන්ත හා සේවා අංශය සඳහා ක්‍රියාවට නැංවිය යුතු බවට හඳුනා ගත් ක්‍රමවත් වැඩපිළිවලක් ලෙසට ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය ස්ථාපිත කරන ලදී. ගෝලීය වර්තාකරණයේ තෙවන පරම්පරාව මුල් කර ගනිමින් ජාතික වශයෙන් ගැලපීමකට ලක් කර එම ආයතනවල තිරසර කාර්යසාධනය වාර්තා කිරිමට උචිත පරිදි හරිත වාර්තාකරණ ක්‍රමවේදයේ මාර්ගෝපදේශය සකස් කර ඇත. තිරසර කාර්යසාධනය පිළිබඳ කර්මාන්ත විසින් කරනු ''ලබන ස්වයං වාර්තාකරණය මගින් කර්මාන්තයන්හි නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රියාවලිය පරිසර හිතකාමී වී ඒ හා සම්බන්ධ අඛණ්ඩ වර්ධනයක් සාක්ෂාත් කිරීමෙහිලා ඉතා වැදගත් වේ.

ආර්ථික, පාරිසරික හා සමාජීය ආකල්ප අනුගමනය කරමින් තිරසර කාර්යසාධනය වාර්තා කිරීමට කර්මාන්ත හා සේවා අංශවලට පහසුකම් සපයමින් දේශිය හා අන්තර්ජාතික වෙළඳපල තුළ පවතින්නා වූ තරගකාරීත්වයට සරිලන අයුරින් කර්මාන්ත හා සේවා අංශ පරිසර හිතකාමී කර්මාන්තකරුවන් සඳහා වර්ණ හා ප්‍රසාද ප්‍රදානය තුලින් කර්මාන්තකරුවන් ඇගයීමට ලක් කිරීම ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදයේ අරමුණයි

ඊට අමතරව,

- ✓ නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රියාවලියේදී උපයෝගි කර ගනු ලබන අමුද්‍රව්‍ය, ජලය, බලශක්තිය සංරක්ෂණය කර ගනිමින් කාර්යක්ෂමව සම්පත් නිසි භාවිතයට කර්මාන්ත හා නිෂ්පාදන අංශ දිරි ගැන්වීමද,
- ✓ බලශක්ති සංරක්ෂණය හා තිරසර ලෙස බලශක්තිය පරිභෝජනය හා පුනර්ජනනීය සම්පත් උපරිම ලෙස භාවිතයට හුරු කර වීමද,
- ✓ පරිසරයට හා ජීවීන්ට හානිකර හා විෂ විමෝචන තත්ත්ව පාලනය කරමින් පරිසර දූෂණය අවම කිරීමද,
- ✓ සියලූම මෙහෙයුම් ක්‍රියාවලීන් තුලින් ජනනය වන්නා වූ කසල ජනනය අවම කිරීම, සම්පත් ප්‍රතිචක්‍රීකරණය හා ප්‍රතිභාවිතයට හුරුකර වීම හා සම්පත් කාර්යක්ෂමතාවය උදෙසා කාර්ය මණ්ඩලවල ආකල්ප හා දැනුම ප්‍රවර්ධනයද,
- ✓ නිෂ්පාදන හා සේවා අංශ කරනු ලබන සමාජ මෙහෙවර ඇගයීමද මෙම ක්‍රමවේදයෙහි අපේක්ෂිත අරමුණු වේ.

වර්තමානය වනවිට කර්මාන්ත හා සේවා අංශයේ ආයතන 130 ක් පමණ ජාතික හරිත වාර්තාකරණ වැඩසටහන සඳහා සම්බන්ධ වී ඇත. ගෝලීය වාර්තාකරණය සඳහා යොමු ව ඇති ශ්‍රී ලංකාවේ බොහෝ කර්මාන්ත හා සේවා ආයතනද ජාතික හරිත වාර්තාකරණයට යොමු වීම කැපී පෙනෙන ලක්ෂණයකි. හරිත වාර්තාකරණ ක්‍රමවේදයට පිවිසෙන කර්මාන්ත හා සේවා අංශ පරිසර දූෂණයෙන් තොරව උපරිම සම්පත් කාර්යක්ෂම තාවයකින් යුතුව ආර්ථික, පාරිසරික හා සමාජීය විචලයයන්ගේ තිරසර කාර්ය සාධනය වාර්තා කරනු ලැබේ. තවද මෙම වැඩසටහන දේශගුණික විපර්යාස අවම කර ගනිමින් පරිසර හිතකාමී නිෂ්පාදන හා සේවා බවට පත් කිරීම උදෙසා දරණු ලබන වෑයමෙහි තිරසර කාර්යසාධනය පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීම සඳහා කර්මාන්ත හා සේවා අංශවලට භාවිතා කළ හැකි මෙවලමකි. කර්මාන්ත හා සේවා ආයතනවල මූල්‍යමය කාර්යසාධනයට අමතරව එම ආයතනයේ ආයතනික යහපැවැත්මටද අදාල වන්නා වූ ආර්ථික, සමාජීය හා පාරිසරික කාර්ය සාධනයේ තිරසර පැවැත්මෙහි අවදානම් කළමනාකරණය සඳහා විශිෂ්ට ප්‍රවේශය ද ඇතුලත් කරුණු හරිත වාර්තා මගින් ඉදිරිපත් කිරීමේ අවකාශය හරිත වාර්තාකරුවන්ට පවතී

2012 වර්ෂයේදී කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇති මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම තුලින් ඒ සඳහා සම්බන්ධ වී ඇති කර්මාන්ත හා සේවා අංශයෙහි ආයතනවලට බලශක්ති කාර්යක්ෂමතාවය, කසල ජනනය අවම කිරීම, මූලාශ්‍රයේදී ම කසල වර්ගීකරණය, ජල නාස්තිය අවම කිරිම, හරිතාගාර විමෝචනය අවම කිරීම, සම්පත් කාර්යක්ෂමතාවය, හරිත ප්‍රසම්පාදනය ජල හා කාබන් විමෝචන පිළිබඳ විගණනයන්ට යොමු වීම තුලින් ඉතා වටිනා ආර්ථික ප්‍රතිලාභ රාශියක් හිමි කර ගත හැකිය. තිරසර කාර්යසාධනය පිළිබඳ දත්ත හා තොරතුරු එක්රැස් කොට දත්ත පද්ධති පවත්වා ගෙන යාම තුලින් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ ඇතුළු අදාල රාජ්‍ය අංශයේ පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතුව රටේ තිරසර සංවර්ධනය සඳහා කර්මාන්ත හා සේවා අංශ ක්ෂේත්‍රයේ සම්බන්ධ තීරණ හා තීන්දු සම්බන්ධයෙන් හරිත වර්තාකරණය මගින් මහගු පිටුවහලක් වනු ඇත. කර්මාන්ත හා සේවා අංශවලට උද්ගත වන්නාවූ ගැටලූ සම්බන්ධයෙන් ඵලදායී තීරණ හා තීන්දු ගැනීමෙහිලා ජාතික හරිත වාර්තාකරණ සම්බන්ධීකරණ කමිටුව ක්‍රියාත්මක වේ. මෙම කමිටුව මගින් ගනු ලබන තිරණ හා තීන්දු අනාගතයේදී පරිසර හිතකාමී නිෂ්පාදන හා සේවාවන් ප්‍රවර්ධනයෙහිලා මහඟු දායකත්වයක් සැපයෙන අතර පරිසර හිතකාමී නිෂ්පාදන මෙන්ම සේවාවන් සඳහා දේශීය මෙන්ම අන්තර්ජාතික වෙළඳපලෙහි තරඟකාරීත්වයට මහත් අත්වැලක් සපයනු ඇත.

ශ්‍රී ලාංකික කර්මාන්ත ප්‍රජාව අද ආර්ථික, සමාජීය හා පාරිසරික විචල්‍යයන්හි කාර්යසාධනය ගණනය කිරීමට හුරු වීමේ ප්‍රයත්නයේදී එම ප්‍රජාවට හරිත වාර්තාකරණය කරා යොමු විය යුතු මට්ටම් 05ක් පවතී. ඉන් එක් මට්ටමක් තෝරාගෙන නිෂ්පාදන හා සේවා අංශවල තිරසර කාර්ය සාධනය වාර්ෂිකව පරිසර හා පුනර්ජනීය අමාත්‍යාංශය වෙත වාර්තා කරනු ලබයි. ඒ සඳහා ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය ආර්ථික විචල්‍යයන් 6ක්ද, සමාජීය විචල්‍යයන් 20ක්ද පාරිසරික විචල්‍යයන් 24ක් ද ඇතුලත් ව විචල්‍යයන් 50කින් සමන්විත වන අතර එම එක් එක් මට්ටම්වලදී නිෂ්පාදන හා සේවා අංශ ක්‍රියාකළ යුතු ආකාරය පරිසර අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කර ඇති ජාතික හරිත වාර්තාකරණ මාර්ගෝපදේශයෙහි වැඩිදුරටත් සඳහන් වේ.

ජාතික හරිත වාර්තාකරණය හා සම්බන්ධ වී ඇති කර්මාන්ත හා සේවා අංශ තිරසර කාර්යසාධනය වාර්තා කිරිම තුලින් නිෂ්පාදන හා සේවා අංශයට, රටේ තිරසර සංවර්ධන ක්‍රියාරාමුව තුළ ආර්ථික සංවර්ධන අභියෝගවලට මුහුණ දීමට හැකි වන අයුරින් එම අංශවල ධාරිතා වර්ධනයට, සමාජයට හා රජයට ඉමහත් ප්‍රතිලාභ රැසක් එමඟින් හිමි වේ. ඒ අතර කර්මාන්ත හා සේවා අංශවලට පරිසර දූෂණයෙන් තොර, එයින් වන්නාවූ දේශගුණ බලපෑම් වැලකීමට හැකි වන අයුරින් තම නිෂ්පාදන හා සේවාවන්ට ප්‍රතිලාභ ලැබෙන්නා වූ ක්‍රමවේදයකි.

වෙන කවර කලකටත් වඩා සිදුවන කාර්මිකරණය හේතුවෙන් කර්මාන්ත විසින් භාවිතා කරනු ලබන පොසිල ඉන්ධන ප්‍රමාණය අඩු කිරීමට වඩාත් කාර්යක්ෂම ලෙස පොසිල ඉන්ධන දහනය වන පරිදි කර්මාන්තකරුවන් බලශක්ති සංරක්ෂණ ක්‍රමවේද වෙත යොමු කෙරේ. ඒ අනුව කර්මාන්ත හා සේවා අංශ භාවිතා කරනු ලබන පොසිල ඉන්ධන මගින් උපරිම අයුරින් බලශක්තිය නිපදවා කාර්යක්ෂම බලශක්ති වැඩබිමක් බවට පත් කරනු ලබයි. එමෙන්ම එම කර්මාන්ත පරිසරයට මුදා හරිනු ලබන කාබන් විමෝචන තත්ත්වයන් පිළිබදව දත්ත හා තොරතුරු යාවත්කාලීන කරමින් කර්මාන්ත මගින් පිට කරනු ලබන කාබන් ප්‍රමාණය අඩු කිරීමට පියවර ගනී. පාරිසරික කාර්ය සාධනයේ එක් එක් අදාල උප විචල්‍යයන්හී දත්ත මගින් ඒ බව වාර්තා කෙරේ. ඒ හා අදාල ක්‍රියාමාර්ග වෙත යොමුවීම මගින් වායුගෝලීය උෂ්ණත්වය අඩු කිරීමටත් දේශගුණික විපර්යාසවලින් දැයම ගලවා ගැනීමට අවශ්‍ය පියවර පියවර ගත හැකිය.

බලශක්තිය ඉතිරි කරනු ලබන යන්ත්‍ර සූත්‍ර හා උපාංග වෙත අවධානය යොමු කරන අතර තිරසාර බලශක්තිය භාවිතය ද දිරිමත් කරනු ලබයි. මෙහිදී මාසිකව කර්මාන්ත ශාලාවල එක් එක් අංශ සදහා වැයවන්නාවූ බලශක්ති මුලාශ්‍රයන් පිළිබඳව ගිණුම් තබා ගනිමින් බලශක්ති ක්‍රමවේදයන් කරා යොමු කරවීම ජාතික හරිත වාර්තාකරණ වැඩසටහන යටතේ ඇති බලශක්ති සම්බන්ධ විචල්‍යයන් මඟින් ඉටු කරනු ලබයි. ඊට අමතරව බලශක්ති ප්‍රභවයක් ලෙස සූර්ය බලශක්තිය, සුළඟ, ජීව වායු දහයියා වැනි පරිසර හිතකාමී බලශක්ති මූලාශ්‍ර කරා යොමු කරවිය හැකිය. තවද, කර්මාන්තකරුවන් අනුග්‍රහය දක්වනු ලබන ස්වේච්ඡා වැඩසටහන් හා ප්‍රජා සහයෝගීතා වැඩසටහන් ක්‍රියාවට නැංවීම මඟින් සාමාජීය වගකීම් යටතේ කර්මාන්ත හා නිෂ්පාදන අංශ මහජන ප්‍රසාදයට ලක්වීම නිතැතින්ම සිදු වේ. කර්මාන්තකරුවන් විසින් පරිසරය ආරක්ෂා කිරීම සදහා සමාජයට ඉටු කරනු ලබන සමාජ මෙහෙවරද කර්මාන්තයේ සේවක සේවිකාවන්ගේ සුභසාධනය හා කර්මාන්තයේ යහ පැවැත්මට බලපාන පරිදි මහජන ප්‍රසාදය උපරිම වන අයුරින් කර්මාන්ත හා සේවා අංශ යොමු කළ හැකිය. මෙවැනි බලශක්ති සංරක්ෂණ ක්‍රමෝපායන් කර්මාන්තකරුවන් විසින් වාර්තා කිරීම තුලින් කාබන් විමෝචනය අවම කිරිමට හැකි වන අතර එලෙස බලශක්ති සංරක්ෂණයට යොමු විම තුලින් වැය බරද අඩු කර ගත හැකි වනු ඇත.

කර්මාන්ත මගින් විමෝචනය වන්නා වූ හරිතාගාර වායූන් පිළිබඳ පමණක් නොව හරිත වාර්තාකරණය මගින් වැඩ බිමෙහි බලශක්ති ක්‍රියාකාරකම් පිළිබඳවද විමසුමට ලක් කෙරේ. එහිදී වැඩ බිමෙහි බලශක්ති හා කාබන් විමෝචනය පිලිබඳ විගණනයන් කරමින් බලශක්ති මුලාශ්‍ර සංරක්ෂණ වැඩපිළිවෙලක් වෙත යොමු කෙරේ. බලශක්ති භාවිතය අඩු කිරීමට හැකි වන අයුරින් බලශක්ති සුරක්ෂිත විදුලි බුබලු භාවිතය, බලශක්තිය පිරිමැසුම් යන්ත්‍ර සූත්‍ර, උප මනු කියවිම හා සූර්යාලෝකය උපරිම අයුරින් ලැබෙන පරිදි ගොඩනැගිලි නිර්මාණයේ සිට යාන්ත්‍රික උපකරණ ස්ථාපිත කිරීම දක්වා අවධානය යොමු කෙරේ. මෙවැනි බලශක්ති සංරක්ෂණ ක්‍රියාකාරකම්වලට යොමු වීමත් සමග මුදල් නාස්තිය අඩුවේ. තවද මෙවැනි දේ තුලින් වායු දූෂණය අවමවීමත් සමඟම පරිසර හිතකාමී තාක්ෂණ ක්‍රමවේද කර්මාන්තශාලා තුළ සවි කිරීමටත් එම උපාංග නඩත්තුව හා සේවා අවශ්‍යතා වෙනුවෙන් හරිත රැකියා වර්ධනයටත් ඉඩ ප්‍රස්ථාව ලැබේ.

කසල ජනනය වන මුලාශ්‍ර යෙදීම වෙන් කිරීමටත් ඒ සඳහා කර්මාන්ත බිම් තුල නිසි වැඩපිළිවෙලක් ඇති කරලීමටත් හරිත වාර්තාකරණය තුලින් අපේක්ෂා කෙරේ. කසල අවම කිරීම හා සුපිරිසිදු නිෂ්පාදන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම හරිත වර්තාකරණය තුළින් කෙරේ. සම්පත් යෙදවුම් කළමනාකරණය, රසායනික ද්‍රව්‍ය සඳහා අවදානම් කළමණාකරණය

සඳහා කර්මාන්ත බිම් තුළ නිසි ප්‍රමිතියෙන් යුත් වැඩ පිළිවෙලක් සැකසීම හා විධිමත් ලෙස සම්පත් භාවිතය තුලින් හදිසි ආපදාවලින් පරිසරයට හා වායුගෝලයට වන හානි අවම කර ගත හැකිවීමෙහි ලා ඉතා වැදගත් වේ. සම්පත් නාස්තිය අවමකරමින් හරිතාගාර වායු විමෝචන තත්ත්ව ප්‍රමිතියෙන් යුතුව පාලනය කරමින් හා මුදල් ඉතිරි කරීම තුළින් කර්මාන්තවල මෙහෙයුම් කාර්ය සාධනය වැඩිදියුණු කිරීමට ඉඩ ප්‍රස්ථාව මෙම වැඩසටහන මගින් කර්මාන්තකරුවන්ට ලැබී නිෂ්පාදන හා සේවා අංශවල කාර්යසාධනය වර්ධනය තුලින් පාර්ශවකරුවන් අතර සහ සම්බන්ධතා වර්ධනය මෙම වැඩසටහන මගින් නිරතුරුවම සිදු වේ.

කසලින් තොර හරිත කර්මාන්තකරණය සඳහා සියලුම කර්මාන්තකරුවන් විසින් ඔවුන් නිෂ්පාදනය කරනු ලබන නිපැයුම්වල ජීවන චක්‍රය ගැන නැවත සිතා බැලීමක් හරිත වාර්තාකරණ ක්‍රමවේදය මගින් සිදුවේ. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අමුද්‍රව්‍ය හා ඇසුරුම් හැකි සෑමවිටම නිෂ්පාදන ආවරණය කිරීමටත් ප්‍රතිචක්‍රීකරණය කරන ලද ඇසුරුම් හා ඇසුරුම් ද්‍රව්‍ය යොදා ගැනීමට හුරු කරවීමේ අරමුණින් කර්මාන්ත භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය/සම්පත් ප්‍රමාණයෙන්, ප්‍රතිචක්‍රීකරණය කළ ප්‍රමාණය හා ප්‍රතිචක්‍රීකරණය කල හැකි ප්‍රමාණය හා ඇසුරුම් අමුද්‍රව්‍ය පිළිබඳ හරිත වාර්තාකරණය මගින් ගිණුම් ලබා ගනී. එමඟින් කර්මාන්තකරුවන්ගේ පොලිතීන් ප්ලාස්ටික් වැනි දිගුකාලීනව දිරාපත් නොවී පරිසරයේ පවත්නා කසල භාවිතයෙන් බැහැර වීම හා ජල පිරිපහදු වියදම් අවම කිරීම මගින් ආර්ථික වාසි ලබා ගත හැකිය. මෙවැනි දේ වාර්තා කිරීමේ අරමුණ වන්නේ කසල ජනනය අවම කර ප්‍රතිචක්‍රීකරණය වෙත යොමු කරවීම තුලින් සම්පත් නාස්තිය අවම කිරීම කෙරෙහි කර්මාන්තකරුවන් තුල ස්වයංවිනයක් කරා නිතැතින්ම යොමු කිරීමය. සුපිරිසිදු තාක්ෂණික ක්‍රියාකාරකම් භාවිතා කිරීම තුලින් නිෂ්පාදන ක්‍රියාවලියන්හි ඵලදායීතාව වැඩි දියුණු වී නිෂ්පාදන වියදම අවම කර ගත හැකිය. එමගින් කර්මාන්ත හා සේවා අංශයන්ට දේශීය හා අන්තර් ජාතික වෙළඳපල තුල තරග කිරීමෙහි හැකියාව ඇති වේ.

පරිසර හිතකාමී නිෂ්පාදන හා සේවාවන් සඳහා ව්‍යාපාරික අවස්ථාවන් හා නව වෙළඳපලවල් හඳුනා ගැනීමට මෙමගින් ඉඩ ප්‍රස්ථා ලැබේ.

නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රියාවලියේදී කර්මාන්තයේ සම්පත් නාස්තිය වලකා කාර්යක්ෂමතාවය උපරිම කරගැනීම තුලින් කර්මාන්තයේ කාර්යසාධනය නියමිත වේලාවට සංසන්දනය කිරීමට හැකිවීම මගින් මූල්‍ය ප්‍රගතියක් ද අත්කර ගත හැකි අතර එමගින් කර්මාන්තවල සේවක සේවිකා පක්ෂයට පමණක් නොව සමස්ත සමාජයටම ප්‍රතිලාභ උදා කර දිය හැකිය. මෙවැනි තත්ත්ව තුලින් පරිසර හිතකාමී දෙස් විදෙස් ආයෝජක සම්බන්ධතාවන් වර්ධනය කරමින් ආයෝජන අවස්ථා පුළුල් වීමටද ඉඩ ප්‍රස්ථාව උදා වනු ඇත.

සම්පත් නාස්තිය හා පරිසර දූෂිත තත්ත්ව වලකා එහි අහිතකර බලපෑම් අවම කිරීමට හැකිවන අයුරින් කර්මාන්ත හා සේවා අංශවලට අවදානම් අවම කිරීම සඳහා මනා කලමනාකරණය කරා යොමු කරවීම මෙමගින් සිදු වේ. මේ අයුරින් හරිත වාර්තාකරණ වැඩපිළිවෙල හා දායක වීම තළින් කර්මාන්ත හා සේවා අංශයට පමණක් නොව සමාජයට මෙන්ම සමස්තයක් වශයෙන් රජයට මහත් පිටිවහලක් සැලසෙන අතර ජාතික සංවර්ධනයට දායකත්වයක් සැපයීමට හැකි වනු ඇත. විෂ දුමින් කර්මාන්ත දූෂණයෙන් තොර පිරිසිදු ජලයට වාතයට ආදරය කරන ශ්‍රී ලාංකීය කර්මාන්ත ප්‍රජාවක් බිහි කිරීම තුලින් තිරසර හෙටක් අනාගත පරම්පරාව වෙනුවෙන් උදා කිරීම අපගේ පැතුම වන්නේය. ඒ අනුව යමින් පරිසර හා පුනර්ජනීය බලශක්ති අමාත්‍යාංශය මගින් ස්ථාපිත කර ඇති ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය පරිසර දූෂණයෙන් තොර සම්පත් කාර්යක්ෂමතාවයෙන් යුතු දේශගුණ විපර්යාස අවම කිරීමෙහිලා නිෂ්පාදන හා සේවා අංශවල දායකත්වය කර්මාන්ත හරිතකරණයෙහි ලා ඉතා වැදගත් මං සලකුණක් වනු බව නො අනුමානය.